*8 වන පිටුවෙන් (ජාතික නිදහස)*

වැඩේ කියන්නේ කොටි සංවිධානයේ කුරිරුකම් ගැන වැඩියෙන්ම කථා කරන්නේ වීරවංශ, සෝමවංශ වගේ ජනතා විමුක්ති පෙරමුණේ කැරලිවලට වගකිව යුතු නායකයින්මයි.

මේ කුරිරු බාබේරිකම සර්පිලා ආකාරයට ඉහළට යනව. පළමුවෙන්ම පීඩනයට පත් වූ අය ජනඝෝෂා කරන විට එය සහාසික ලෙස මර්ධනය කරනව. මෙය දිගින් දිගට යනකොට ඉවස ගන්න බැරි පීඩිත ජනයා සහාසික ප්‍රචණ්ඩත්වයට බහිනව. එය පැතිරී යනකොට අවසන් තුන්වන අවධියට එනව. පාලකයෝ කුරිරු මැඩලීම්වලින් සිවිල් සමාජයම යට කරල දමනව. මේ පියවර තුන හරහා තමා සෑම රටකම බාබැරික් තත්වයන් උදාවෙලා තියෙන්නේ. ලංකාව තුළත් මේ මතුවෙලා තියෙන්නේ දරුණු බාබැරික් තත්වයක්. අපි ඇවිත් ඉන්නේ තුන්වැනි අවදියට. මේ ගැන වැඩියෙන්ම වග කියන්න ඕනෑ දෙමළ ජාතික ප්‍රශ්නයට විසඳුමක් දෙන්න අකමැති සිංහල ජාතිවාදී සංවිධාන. ඒක අප අතරම විසඳා ගන්න බැරි වූ නිසා මුළු රටම දැන් ලෝක ජාවාරම්කාර බලවේගයන්ට යටවෙලා තියෙන්නේ. හැම ගසාකන්නෙක්ම මේ රටට කඩා පැනීමට මෙය සාධකයක් කරගෙන.

පාලකයාගේ බාබේරිකම තුළින් ප්‍රශ්න විසඳනවා කියන එක ලොකුම මෝඩකමක්. මොකද? නැවතත් පීඩිතයා අළුත් වටයකින් ජනඝෝෂා අරඹන නිසා. දකුණේ තරුණයාගේ සටන මර්ධනය කළත් එය පවතින පාර්ලිමේන්තු රාමුව තුළින් ශක්තිමත්ව ඉදිරියට ඇවිත් දැන් රාජ්‍ය පාලනය තුළටත් කාවදින තැනට ඇවිත්. ඊළඟට කොයි වේලේ හරි ඔවුන් පහළට ඇද දැමීමට මර්ධනය පටන් ගනීවි. මෙය නවත්වන්න නම් මේ දෙපැත්තෙම ගැමි තරුණ බලවේග ඇත්ත සතුරන්ට විරුද්ධ වීමට එකට එකතු වෙන්න ඕනෑ. ඇත්ත සතුරා රට තුළම සිටින තවත් ජන කොටසක් නෙවෙයි, පාලකයින් තුළ ඇති ගෝලීය බලවතුන්ගේ නයාය පත්‍රයයි.

මහින්ද රජය දැන් ඒ ලෝක බලවතුන්-ගේ ඒජන්තයෙක්. ඔහු කරන්නේ සිංහ කොඩිය වනවනා, දූෂණය, හොරකම, වංචාව, ඝාතන, මැරකම හා ගසාකෑම් ආරක්ෂා කරගැනීම විතරයි. මේ වගේ පාලකයන්ගේ විළි වහගන්න, උන්ගේ දෝස්මුර වහගන්න සිංහ කොඩිය යොදා ගත්ත වකවානුවක් කවදාවත් තිබ්ල නෑ. අද ජාතික නිදහස, සාමය, ජීවත්වීම වෙනුවෙන් හැම කෙනෙකුටම එකතුවෙලා සටන් කරන්න වෙනව. මේ හරහා පාර්ලිමේන්තු බලය හා ජනාධිපති බලය ගන්න සමහරු හිතනව ඇති. ඒත් අපි කරන්න ඕනෑ ඒ අරමුණ වෙනුවට ජනතා බලය ගොඩනගා ගැනීමට පොදු සටන යොදා ගැනීමයි. අද හැමට තිබෙන රාජකාරිය එයයි.

---

*5 වන පිටුවෙන් (කුට්ටම් පොකුණ)*

බැමිණිය එය නොපෙන්වා "එසේය පුත්‍රය" ඔබගේ අනුශාසන, අවවාද මම සතුටින් පිළිගතිමි. එන්න මා අසලට මාහට නුඹ පිළබඳව ස්නේහයක් උපන් නිසා මා නුඹට ආදරෙයි. ව්‍යාජ ආදර බස් ඇසූ ගිරවා ඈ අසළට ලංවිය. ක්ෂණිකයෙන් උෟ අල්ලා බෙල්ල කරකවා මරා දැමූ බැමිණිය එතැනින් නොනැවතී උෟ පුළුස්සාද දැමුවාය. මෙය දුටු අනෙක් රාධා ගිරවා බමුණාගෙන් අවසර ගෙන වනාන්තරයට පළා ගියේය.

දැනුදු එලෙසම අපේ රටේ සමහර මාධ්‍යකරුවන් රට හැර පලා යති. ඒ නිසා එම රාධා ජාතකය දැනුදු අපේ රටට කාලෝචිතය. එයින් ලබාදෙන වැදගත්ම පණිවුඩය වන්නේ නුවණැත්තෝ නුසුදුස්සන්ට නුසුදුසු කාලයට යහපත් අවවාද දීමෙන් වුවද වැළකී සිටිය යුතුය යන්නයි. අද අපිට සිදුවී ඇත්තේ එයම නොවේද?




